# ‘පට්ඨාන’ ධර්ම දේශනා මාලාව
# ‘වීථි වාර - ආරම්මණ ප්‍රත්‍යය’
# 10. 05. 2018

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

තුන්ලෝකාග්‍ර වූ භාග්‍යවත් වූ අරහත් වූ තථාගත සර්වඥ ධර්මරාජයාණන් වහන්සේට තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේට අනන්ත කරුණා ගුණයකින් සමන්නාගත වූ අනන්ත ඥානයකින් සමන්නාගත වූ සම්මා සම්බුදුපියාණන් වහන්සේට මම නමස්කාර කරනවා මාගේ නමස්කාරය වේවා!

ඒ සම්මා සම්බුදුරජාණන් වහන්සේ විසින් මහත් උත්සාහයෙන් අවබෝධකොට ගත්තා වූ සුපරිසුද්ධ වූ ධර්ම ස්කන්ධයට ධර්ම රත්නයට මම සිරසින් වැඳ නමස්කාර කරනවා මාගේ නමස්කාරය වේවා!

ඒ උතුම් වූ ධර්ම ප්‍රතිපදාවේ ගමන්කොට නිර්වාණ ධාතුවට පත්වී නිවී ගියාවූ අෂ්ඨාර්යපුග්ගල මහා සංඝරත්නයට මම සිරසින් වැඳ නමස්කාරය කරනවා. මාගේ නමස්කාරය වේවා!

බුද්ධරත්නයේ ධර්මරත්නයේ සංඝරත්නයේ අනන්ත වූ අපරිමාණ වූ ගුණානුභාව බලයෙන් බුද්ධ ධම්ම සංඝ යන ත්‍රිවිධ රත්නයට ඒක චිත්තක්ෂණයක් හෝ වේවා ගුණ සිහිපත්කොට වන්දනා කිරීමේ කුසල චේතනාවේ ආනුභාව බලයෙන් ඒවාගේම මේ පින්වත් සෑම දෙනාම මේ මොහොත වෙනකොට උපදවාගෙන තිබෙන්නා වූ සියලුම පිරිසිදු පුණ්‍ය ධර්මයන්ගේ කුසල ධර්මයන්ගේ ආනුභාව බලයෙන් අදත් මේ හැමදෙනාටම මේ කියලා දෙන ධර්ම කාණ්ඩය ඒවාගේම ඉදිරිපත් කරගන්නා වූ ධර්ම කොට්ඨාසය ඉතාමත් හොඳින් අවබෝධ කරගන්න ලැබේවා! ඒවාගේම ඒ සඳහා මනසිකාරය යොදන්න හැකිවේවා! කිසිම පටලැවිල්ලක් නැතුව ඉතාමත් හොඳින් පැහැදිලිව පිරිසිදුව මේ ධර්ම කරුණු තේරුම් අරගෙන ධර්ම මාර්ගයේ ගමන්කොට උතුම් නිවනින් සැනසෙන්න ලැබේවා! කියලා අපි පළමු කොටම මෛත්‍රීයෙන් ප්‍රාර්ථනා කරනවා. එසේ ප්‍රාර්ථනා කරමින් මේ වේලාවේදී කියන්න බලාපොරොත්තු වෙන්නාවූ දහම් කරුණු ටික අපි කියනවා.

මේ දවස්වල කථා කරන්නේ ආරම්මණ ප්‍රත්‍යය පිළිබඳව. ඒ කියන්නේ අරමුණක තිබෙන්නා වූ ප්‍රත්‍යය ශක්තිය ක්‍රියාත්මක වෙන විදිය, ඒ අරමුණ තවත් එකකට බලපාන විදිය තමයි අපි පසුගිය සති කීපය තුල කථා කළේ. කුසල වීථි කියලා තිබෙනවා කොටසක් ඒ කුසල වීථි එහෙම නැත්නම් ආරම්මණ ප්‍රත්‍යය යටතේ වීථි යෙදෙන තාලේ අපි ගොඩවල් තුනක කථා කරනවා. මම මෙහෙම කියනකොට පට්ඨානය පැත්තට හිත යොදාගෙන ඉන්නා වූ පින්වතුන්ට තේරේවි දැනේවි මේ මොකක්ද කියන්නේ කියලා. මේ පින්වතුන්ට මතක

ඇති අපි ඉස්සෙල්ලාම මාතෘකාව බෙදුවා. ඒ කියන්නේ ‘කුසල’ ‘අකුසල’ ‘අව්‍යාකෘත’ වශයෙන්. එහෙම කියලා ඊට පස්සේ තමයි ප්‍රත්‍යය විභාගය අපි පටන් ගත්තේ. මීට කලින් අපි කියලා දුන්නා කොහොමද **කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස ආරම්මණපච්චයෙන පච්චයො** කියලා කුසල ධර්මයක් කොහොමද කුසල ධර්මයකට ආරම්මණ ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙන්නේ කියලා. ඊට පස්සේ කිව්වා කොහොමද කුසල ධර්මයක් අව්‍යාකෘත ධර්මයකට ආරම්මණ ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙන්නේ කියලා. අද කථා කරන්නේ අකුසල ධර්මයක් අකුසල ධර්මයකට කොහොමද ආරම්මණ ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙන්නේ කියලා.

ඒක හරි වටිනවා. මම එතැනින් ආරම්භ කරනවා. පාලි පාඨය තිබෙන්නේ මෙහමයි.

4වෙනි වීථිය

**අකුසලො ධම්මො අකුසලස්ස ධම්මස්ස ආරම්මණපච්චයෙන පච්චයො** කියලා විග්‍රයක් කරනවා.

අකුසල ධර්මයකගේ පහළ වීමට අකුසල ධර්මයක්ම ප්‍රත්‍යය වෙනවා. එතකොට අකුසල ධර්මයන්ගේ තිබෙනවා අකුසල ධර්මයක් හැටියට පහළ වෙන ගතිය. ඒ අකුසල ධර්ම පහළ වෙනකොට අරමුණක් නැතුව පහළ වෙන්නේ නෑ. අකුසල ධර්මයටත් අරමුණක් අවශ්‍යයයි. අකුසල ධර්මයක් පහළ වෙනකොට ඒකට අරමුණක් හැටියට අකුසල ධර්මයක්ම පහළ වෙනවා. ඒ කථාව තමයි මේ කියන්නේ. එතකොට අකුසල ධර්මයක තිබෙනවා අකුසල ධර්මයකට ආරම්මණ ශක්තියෙන් ඉදිරිපත් වෙන ස්වභාවය. අපි බලමු මෙහෙම.

අකුසල සිත් තිබෙනවා 12ක්. චෛතසික ධර්ම තිබෙනවා 27ක්. අපි මීට කලින් ඕක කිව්වා. මේ ටික තමයි අකුසල ධර්ම කියලා කියන්නේ. මේවා මනෝමය ධර්ම. නාම ධර්ම. හිතකුත් චෛතසික සමූහයකුත් පහළ වෙනකොට ඒ පහළ වීමට මොකක් හරි ආරම්මණයක උපකාරයක් උදව්වක් අවශ්‍යයයි. එතකොට තමයි මේවා පහළ වෙන්නේ. මේ නාම ධර්ම පහළ වෙනකොට ආරම්මණ ප්‍රත්‍යය ශක්තියක් ඒකට එක්කාසු වෙනවා. එක්කාසු වෙනවා කියලා කියන්නේ අරමුණු වීම් වශයෙන්. එතකොට මේක වෙන විදිය අපි බලමු.

මේකේ තිබෙනවා කෙලෙස් කියලා ජාතියක්. මෙහෙම බලන්න, මේ වීථිය ගැන සලකන කොට

- **රාගං අස්සාදෙති රාගං අභිනන්දති; තං ආරබ්භ රාගො උප්පජ්ජති, දිට්ඨි උප්පජ්ජති, විචිකිච්ඡා උප්පජ්ජති, උද්ධච්චං උප්පජ්ජති, දොමනස්සං උප්පජ්ජති.**

හොඳට බලාගන්න. රාගය දිට්ඨිය විචිකිච්ඡාව උද්ධච්චය දෝමනස්සය. මේ වෙලාවට මෙතැන තිබෙනවා ධර්ම 5ක්. මේවා තමයි කෙලෙස්. මේ ධර්ම ටික චෛතසික ධර්ම. මේ චෛතසික ධර්ම උපදින්නේ එක්කෝ ලෝභ මූල සිත් අටේ. එහෙම නැත්නම් ද්වේශ මූල සිත් දෙකේ. නැත්නම් මෝහ මූල සිත් දෙකේ. ඔය සිත් 12 තමයි මේ චෛතසික

ධර්ම පහළ වෙන්නේ. එතකොට තමන්ගේ හිතේ රාගයක් ඇති උනහම ඒ ඇති වෙච්ච රාගය කියන ධර්ම ස්වභාවය ඒ ඇලීම් ස්වභාවය හොඳයි කියලා රසයි කියලා ඒ ගැන හොඳට සතුටු වෙනවා. ඒ ගැන ආස්වාදනය කරනවා. ඒ ගැන ප්‍රීතිමත් වෙනවා. එහෙම වෙනකොට ඒ රාගය අරමුණු කරගෙනම රාගය උපදිනවා. (එක වේලාවේම නොවෙයි) මේක ප්‍රයෝගිකව තේරුම් ගන්න පුළුවන් මෙහෙම.

සමහර වෙලාවට තරුණ අය එකිනෙකාට කිට්ටුවෙලා ළං වෙලා අල්ලාප සල්ලාප කථා කරමින් ඒවාගේම රාගික ස්වභාවයක් ඉදිරිපත් කරගෙන ඒ අය යනවා එනවා ගැවසෙනවා ඉන්නවා. දැන් මේ තරුණ අය මේ විදියට හැසිරෙන්නේ මේ රාගයේ තිබෙන්නා වූ උද්දීපනය නිසා. දැන් මේක දිහා බලාගෙන ඉන්නවා කෙනෙක්. ඒක බලාගෙන ඒ දෙන්නා රඟ පාන විදිය, කථා කරන විදිය, ඉන්න විදිය ඒවාගේම විහිළු තහළු කරන විදිය දැකලා ඒ දිහා බලලා ඊට පස්සේ ඒක හොඳයි කියලා ඒකට රාගය උපදවනවා. ආන්න ඒකට තමයි කියන්නේ **රාගං අස්සාදෙති අභිනන්දති** කියලා. එතකොට කෙනෙකුගේ ඒ ආස්වාදනය කරන ඒ හිත කෙලෙස් හිතක්. ඒක අකුසල ධර්මයක්. ඒ අකුසල ධර්මයට ආරම්මණ ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙන්නේ අර දෙන්නාගේ තිබෙන්නා වූ රාගයයි. ඒක නිසා තමයි කියන්නේ **රාගං අස්සාදෙති අභිනන්දති** කියලා.

**තං ආරබ්භ රාගො උප්පජ්ජති** = අපි හිතමු කෙනෙකුගේ හිතකට මීට කලින් පහළ වෙච්ච ඒ රාග සිත තමන් නැවත නැවත හිතනකොට එතැනදී පහළ වෙන්නේ තමා තුලින් පහළ වෙච්ච ඒ රාගයම ඒ අකුසලයම අරමුණු කරගෙන තවත් අකුසල ධර්මයක් පහළ වෙනවා. **අකුසලො ධම්මො අකුසලස්ස ධම්මස්ස ආරම්මණපච්චයෙන පච්චයො.**

ඊළඟට දෘෂ්ඨිය පහළ වෙනවා. මේ මනුස්සයෙක් සැප විඳිනවා මේ දෙවියෙක් විඳිනවා කියලා ඒ රාගයට දෘෂ්ඨිය එක්කාසු කරනවා. එහෙම නැත්නම් සැක එකතු කරනවා. එහෙම නැත්නම් කැළඹිල්ලක් ඇති කරගන්නවා. එහෙම නැත්නම් වෙනත් කෙනෙක් සන්තෝසයෙන් සතුටින් රාගයෙන් ඉන්න වෙලාවක ඒකට තරහ උපදවනවා. එහෙම නැත්නම් එය නොමනා දෙයක් හැටියට හිතනවා. ඕක දකින්න පුළුවන් වයසක මිනිස්සු ගාව. අපි ගොඩක් දකිනවා වයසක මිනිස්සු තරුණ අයට කැමති නෑ. ඔක්කොම නොවෙයි, සමහර අය. තරුණ අය හිනහ වෙනවට ළං වෙලා කථා කරනවට මුකුළු කරනවට විහිළු තහළු කරනවට ඒ අය කැමති නෑ. එතැන තිබෙන්නේ ඒ තරුණ අයගේ හිත්වල පහළ වෙන්නා වූ රාගික ස්වභාවයට දෝමනස්සයක් පහළ කරනවා ඒ අය. අනිත් අය සම්බන්ධයෙන් එහෙම ඒවා තිබෙනවා. ඒ දෝමනස්සය කියන එක පහළ වීමට ඒ තරුණ අයගේ තිබෙන්නා වූ අල්ලාප සල්ලාප රාගී ස්වභාවයන් ඒ අකුසල ධර්මයන් ආරම්මණ ස්වභාවයෙන් ප්‍රත්‍යය වෙනවා.

නමුත් ඒ වගේ අය කියන්නේ නෑ මම මේ තරුණ අයගේ සතුටට සන්තෝසයට අකමැතියි කියලා. සමහර වෙලාවට ඒක වහ ගැනීම සඳහා යොදාගන්නේ සංස්කෘතිය ශිෂ්ටාචාරය හැදියාව වගේ දේවල් වලින් තමයි ගොල්ලො තමන්ව cover කරගන්නේ සහ තමන්ට වෙන හානිය වලක්වා ගන්නේ. ඒ දෝමනස්සය ආවට පස්සේ තමන්ට තරුණ කමක් තිබුණා කියන එක ඒ වේලාවට අමතක වෙනවා.

දැන් බලන්න **රාගය දිට්ඨිය විචිකිච්ඡා උද්ධච්ච** සහ **දෝමනස්ස** යන ධර්මය තවත් කෙනෙකුගේ සිතේ සහ තමන්ගේ හිතේ පහළ වෙන විදිය.

ඒ වාගේම තමයි තමන්ගේ සිතට ඉස්සෙල්ලා පහළ වෙච්ච රාගයක් ඇත්නම් ඒ ගතියටම සමහර වෙලාවට තරහ යනවා. තරහ යන ගතිය හඳුනාගන්න පුළුවන් සමහර වෙලාවට භාවනා වැඩ සටහන් වලදී. භාවනා වැඩ සටහන් වලදී අකුසල් ඇතිවෙනවා. භාවනාවකදී 'මගේ හිතට කාමච්ඡන්දය ආවා' 'අකුසල් සිතුවිලි ආවා' 'ව්‍යාපාදය ආවා' 'ඒක නවත්වන්න බැනේ' කියලා තමන්ට තමන්ගේ හිතේ පහළ උනා වූ ඒ අකුසලය පිළිබඳව අකුසලයක් පහළ වෙනවා. ඒක **අකුසලො ධම්මො අකුසලස්ස ධම්මස්ස ආරම්මණපච්චයෙන පච්චයො.** එහිදී අරමුණක් හැටියට ඉදිරිපත් වෙන්නේ අකුසල ධර්මයක්මයි.

ඊළඟට තව එකක් තිබෙනවා. **දිට්ඨියත්** ආස්වාදනය කරනවා. ඒවාගේම දෘෂ්ඨිය නිසා 'මම' 'කෙනෙක්' කියලා මිත්‍යා දෘෂ්ඨියම ආස්වාදනය කරනවා. ඒකට සතුටුවෙනවා. ඒවාගේම මිත්‍යාදෘෂ්ඨියට කැමති වෙනවා. මිත්‍යා දෘෂ්ඨියම දෘෂ්ඨියක් කරගන්නවා. මිත්‍යා දෘෂ්ඨිය ගැනම උද්ධච්චය ඇතිවෙනවා. මිත්‍යා දෘෂ්ඨියක් ඇති උනාට පස්සේ ඒ ගැන දෝමනස්සයක් ඇති වෙනවා. එතකොටත් දෘෂ්ඨිය කියන අකුසල ධර්මය විචිකිච්ඡා උද්ධච්ච දොමනස්ස වශයෙන් අකුසල ධර්ම පහළ වීමට ආරම්මණ ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා. මෙතැනදී දෘෂ්ඨිය කියලා පුද්ගල දෘෂ්ඨිය ආත්ම දෘෂ්ඨිය ඒවාගේම මගේ කියලා ගන්න ගතිය ප්‍රායෝගික ජීවිතියේදී සලකා ගන්න පුළුවන් මෙහෙම.

අපි හිතමු කෙනෙකුට ඉඩමක් තිබෙනවා. ඒ ඉඩම ඇත්තටම කෙනෙකුට නීත්‍යානුකූලව ලියලා පවරලා තිබෙන්නේ. ඒක අයිතිකාරයාගෙන් තව එක්කෙනෙක් පැහැරගෙන තිබෙනවා. අපි හිතමු හොර ලියවිල්ලක් හරි මොකක් හරි කරලා එයා ගත්තා කියලා. පළවෙනි එක්කෙනා ඒ කියන්නේ නියම අයිතිකාරයා ඒකට කටයුතු කරනවා. කටයුතු කරලා තමන්ට අයිති දේ ගැන 'මම තමයි මේකේ අයිතිකාරයා, මේක මගේ, මට තමයි හිමි' කියලා ඒක ග්‍රහණය කර ගන්නවා. එතකොට මේක ජේන්නේ ලෝභය වගේ. නමුත් දෘෂ්ඨිය තේරුම් ගන්නයි මේක පාවිච්චි කරන්නේ. දැන් කෙනෙක් ඕක දැකලා ඊට පස්සේ කියනවා 'ඒ කරපු වැඩේ හරි, තමන්ට අයිති දේ තමන් ගත්තා. තමන්ගේ දේ කිසිකෙනෙකුට දෙන්න ඕනේ නෑ' කියලා. එතැනදී වෙනත් කෙනෙකුගේ දෘෂ්ඨියක් අරමුණු වෙනවා තවත් කෙනෙකුට අකුසල ධර්ම පහළ වෙන්න. අනිත් එක තමයි තමන්ගේ සිතේ පහළ වෙච්ච දෘෂ්ඨියටත් දෘෂ්ඨිය පහළ වෙනවා. 'මේක හරි, මේ මම හිතපු තාලේ' කියලා තමන්ගේ දෘෂ්ඨියටත් දෘෂ්ඨිය පහළ වෙනවා. ඒක නිසා මේ දෘෂ්ඨිය කියලා කියන්නේ තමන්ගේය, මමය කියන්නා වූ සක්කාය දෘෂ්ඨිය මුල් කරගෙන තිබෙන්නා වූ මිත්‍යා අදහස්.

දැන් එතකොට රාගය වෙනුවෙන් රාගය පහළ වෙනවා. **අකුසලො ධම්මො අකුසලස්ස ධම්මස්ස ආරම්මණපච්චයෙන පච්චයො.** ඒවාගේම දෘෂ්ඨිය පහළ වෙනකොටත් ඒ දෘෂ්ඨිය අරමුණු කරගෙන අකුසල ධර්මයන් පහළ වෙනවා. **අකුසලො ධම්මො අකුසලස්ස ධම්මස්ස ආරම්මණපච්චයෙන පච්චයො.**

ඊළඟ ක්ලේශය තමයි විචිකිච්ඡාව කියන සැකය. සැකය ගැනත් පහළ වෙනවා සැකය. සැකය ගැන පහළ වෙනවා දෘෂ්ඨිය. සැකය ගැන පහළ වෙනවා උද්ධච්චය. සැකය ගැන පහළ වෙනවා දෝමනස්සය. ඕවා දකින්න පුළුවන් තැන් තමයි භාවනාව කරගෙන ගියාට පස්සේ භාවනා වැඩ සටහන් වලදී ඕවා හොඳට පහළ වෙනවා. සමහර මිනිස්සුන්ගේ තිබෙනවා හිත් හරි ඉක්මන් සෝවාන් වෙන්න. හරි ඉක්මන් කමක් තිබෙනවා මාර්ග ඵල ධර්ම අවබෝධ කරගන්න. ඒක හොඳයි. ඒකට තිබෙන ඡන්දය හොඳයි. කැමැත්ත හොඳයි. හැබැයි ඒ කැමැත්ත තදබල විදියට තිබෙන නිසා රැවටෙන අවස්ථා තිබෙනවා. ඒක, යම් කිසි ධර්මඥානයක් ධර්ම දැනුමක් තිබෙන්නා වූ කෙනෙක් යම් කිසි කෙනෙකුට තමන් හිතාගෙන ඉන්නාවූ මාර්ග ඵල ධර්ම පිළිබඳව සාකච්ඡාවක් කරලා එයාගේ මනසේ තිබෙන්නා වූ ධර්ම අවබෝධය පිළිබඳව පැහැදිලි විග්‍රහයක් කරලා ඒකෙ තිබෙන්නා වූ යම් කිසි සත්‍යයතාවයක් ධර්මානුකූලව කියලා දුන්නොත් එයා ඉස්සරවෙලා හිතාගෙන හිටපු ඒ මාර්ග ඵල ආදිය අවබෝධය ගැන හිතින් ධර්මානුකූලව බලනකොට ඒවගේ දෙයක් නෑ කියලා එයාට අවබෝධ වෙනකොට එයා ඉස්සරවෙලා හිටියේ මුලාවක කියලා තේරෙනකොට 'මම මුලා උනා, මම මේක සැක කළා, ඇත්තට ඒක එහෙමද? ඇයි මට මෙහෙම උනේ' කියලා පස්සේ තමන් ගැනම තමන්ට සැක පහළ වෙනවා. සැකය අරමුණු කරගෙන සැකය පහළ වෙනවා. ඒක ගොඩක් දකින්න පුළුවන් භාවනා කරගන යන අය තුල. ඇත්තටම සමහර වෙලාවට ධර්ම අවබෝධය ගැන තමන්ට සැකයි හරිද වරදිද කියලා. ඒ සැකය අරමුණු කරගෙන සැකයක් පහළ වෙනවා. **විචිකිච්ඡං ආරබ්භ විචිකිච්ඡා උප්පජ්ජති**. සමහර වෙලාවට හිතනවා මේක හරි. සමහර වෙලාවට හිතනවා මේක වැරදියි. ඒ තමයි විචිකිච්ඡාව. ස්ථිර තත්වයකට යන්න බැරි ගතිය. ඒවගේම තමයි දෘෂ්ඨිය උපදිනවා. නොසන්සුන් කම උපදිනවා. උදධච්චය පහළ වෙනවා. සමහර වෙලාවට හිතෙනවා ඇයි මට මෙහෙම උනේ කියලා.

දැන් දෝමනස්සය උපදින ආකාරය ගැන හිතන්න. දෝමනස්සය පහළ වෙනවා මෙහෙම. ඇත්ත වශයෙන්ම අපි භික්ෂුන්වහන්සේලා හැටියට මිනුස්සුන්ට ධර්ම අවබෝධය ලබා ගැනීම පිණිස බණ දේශනා කරනවා. ධර්මය කියලා දෙනවා. ධර්මය පැහැදිලි කරනවා. ධර්ම කරුණු විග්‍රහ කරලා තථාගත ධර්මයට අනුව කියලා දෙනවා. හැබැයි කවදාකවත්ම අපි භික්ෂුන් වහන්සේලා හැටියට අනිත් අය සෝවාන් කරන්නේ නෑ. ඒක කරන්න බෑ. බුදුරජාණන් වහන්සේටත් කෙනෙක්ව සෝවාන් කරන්න බෑ. ඒ බැරි වැඩ බුදුරජාණන් වහන්සේ කරන්න යන්නෙත් නෑ. කරන්න කියලා කියන්නෙත් නෑ. අපිට ඒක කොහොමත් බෑ.

එක තැනක තිබෙනවා සාරිපුත්ත මහ රහතන්වහන්සේ පිළිබඳව ලස්සන කියමනක්. ඒ කියන්නේ සච්චවිභංග සූත්‍රය දේශනා කරනකොට තැනක තිබෙනවා මුගලන් ස්වාමීන්වහන්සේ සහ සැරියුත් ස්වාමීන්වහන්සේ පිළිබඳව කරන කථාවක්. සාරිපුත්ත ස්වාමීන්වහන්සේට කෙනෙක් සෝවාන් කරන්න පුළුවන් මුගලන් ස්වාමීන්වහන්සේ ඒ අය සකෘදාගාමී අනාගාමී අරහත් කරන්න පුළුවන් කියලා. හැබැයි ඒ සූත්‍ර දේශනා වල එහෙම කියලා නෑ. අපි ධර්ම දේශනා කරනවා අනිත් අයට ධර්ම අවබෝධ කරගන්න. අනිත් අයව සෝවාන් කරන්න බෑ. සැරියුත් ස්වාමීන්වහන්සේත් අනිත් අයව සෝවාන් කළේ නෑ.

නමුත් අනිත් කෙනෙකුට සෝවාන් වීම පිණිස උපකාර වෙන ධර්මයේ හික්මෙව්වා. ඒ ධර්මයට යොමු කළා ධර්ම කාරණා කියලා දෙමින්. ඒකෙ තිබෙන්නේ මෙහෙමයි.

**"සාරිපුත්තො, භික්ඛවෙ, පහොති චත්තාරි අරියසච්චානි විත්ථාරෙන ආචික්ඛිතුං"** = "මහණෙනි මේ සැරියුත් ස්වාමීන්වහන්සේ චතුරාර්ය සත්‍යය ධර්මයන් විස්තර කරලා කියලා දෙන්න හරි දක්ෂයි". ඒක කරන්න පුළුවන්. **"සාරිපුත්තො, භික්ඛවෙ, සොතාපත්තිඵලෙ විනෙති"** කියලා කියන්නේ "සැරියුත් ස්වාමීන්වහන්සේ අනිත් භික්ෂුන් වහන්සේලාව සෝවාන් ඵලයට පත් වීමට මාර්ගයේ හික්මවනවා" කියලා. ඒ කියන්නේ මාර්ගය කියලා දෙනවා දේශනා කිරීම් වශයෙන්. ඔච්චරයි කරන්න පුළුවන්. ඉතින් මේ සමහර අය අපි සෝවාන් කරන්නේ නැති නිසා අපි ඒවා දෙන්නේ නැති හින්දා තරහයි. තරහයි කියලා කියන්නේ අමනාපයි. ඇත්තටම දෙන්නේ නෑ. එහෙම දෙන්න බෑ. ධර්මය කියලා දෙනවා අනිත් අයට ධර්ම අවබෝධයෙන් එතරට යන්න. තථාගතයන් වහන්සේගේ ධර්මයත් එහෙමයි. යම් කිසි කෙනෙක් භාවනා කරලා බණ අහලා තමන් මුලාවට පත්වෙනවා. මුලාවට පත්වෙනවා කියලා කියන්නේ එයා හිතා ගන්නවා 'මම මේ තත්වයට පත් උනා කියලා. ඇත්තටම තමන් පත් වෙච්ච නැති දෙයක් තමන් අත්දැකපු නැති ධර්මයක් අත්දැක්කා කියලා අවබෝධ කරපු නැති දෙයක් අවබෝධ කළා කියලා එන්නේ මුලාවක්. ඒක කුසලයක් නොවෙයි. ඒක මුලාවක්. ඒක නැති දෙයක් ඇති දෙයක් හැටියට වරදවා සිතා ගැනීමක්. එතකොට ඒකෙ සැකය නැති වෙලා නෑ. ඕක අපි කියපු ගමන්ම අපි කෙරෙහි දෝමනස්සය පහළ වෙනවා. ඊළඟට එයාගේ හිතේ තිබිච්ච සැකය කෙරෙහි දෝමනස්සයක් පහළ වෙනවා.ආන්න ඒ තමයි විචිකිච්ඡාව ගැන තරහ ඇතිවෙන හැටි. තමනුත් සැක කරනවා. ඒවාගේම කියලා දීපු එක්කෙනා ගැනත් දෝමනස්සයක් ඇති කරගන්නවා. **අකුසලො ධම්මො අකුසලස්ස ධම්මස්ස ආරම්මණපච්චයෙන පච්චයො** = අකුසල ධර්මය අකුසල ධර්මයටම අරමුණු වෙන ආකාරය.

උද්ධච්චයත් ඒවගේ. ඊට පස්සේ හෝ ගාල හිතන්න පටන් ගන්නවා. අනිත් එක තමයි **දොමනස්සං ආරබ්භ දොමනස්සං උප්පජ්ජති.** තරහ අරමුණු කරගෙන තරහම උපදිනවා. ඔය සමහරු කියනවා 'මට පුදුම තරහක් ආවා ඒක මට හරි අමාරුයි ඉවසගන්න' කියලා කියනවා. ඇයි මට මේ විදියට තරහ යන්නේ කියලා තරහ අරමුණු කරගෙන තරහ ඇතිවෙනවා. දෝමනස්සය අරමුණු කරගෙන දෝමනස්සය ඇතිවෙනවා = **අකුසලො ධම්මො අකුසලස්ස ධම්මස්ස ආරම්මණපච්චයෙන පච්චයො.** මේ ධර්ම වල තිබෙනවා පුදුම විදියේ අනිත් ඒවාට එක්කාසු වෙන අනිත් ඒවාට ආරම්මණ ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙන එක්තරා විදියක ස්වභාවයක්. ඒක තමයි මේ කියන්නේ.

ඊළඟට අනිත් කාරණය.

<u>5 වෙනි වීථිය</u> **- අකුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස ආරම්මණපච්චයෙන පච්චයො**

අකුසල ධර්මයක් කුසල ධර්මයකට අරමුණු වෙනවා. එහෙම එකකුත් තිබෙනවා. සති පට්ඨාන සූත්‍රයේදී ඕක ප්‍රායෝගිකව කරන්න කියපු තැනකුත් තිබෙනවා. අකුසල ධර්මයක්

කුසල ධර්මයක පහළ වීමට අරමුණු වෙනවා. ඒ කියන්නේ ආරම්මණ ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා. ඒක අපි තේරුම් ගනිමු මෙහෙම. අකුසල ධර්ම තමයි ප්‍රත්‍යයේ තිබෙන ආරම්මණ භාවයට පත් වෙන දේවල්. ඊළඟට කුසල ධර්ම තමයි ප්‍රත්‍යය උප්පන්න වෙන්නේ. ඒක මෙහෙම හිතන්න. අපිට මීට කලින් පහළ වෙනවා රාගය ද්වේශය විචිකිච්ඡාව දෝමනස්සය මාන්නය වගේ අකුසල ධර්ම. ඒ අකුසල ධර්ම පහළ වෙච්ච බව දැනගෙන අපි කුසල හිතකින් ඒ දිහා බලනවා. ඥානවන්තව උපේක්ෂා සහගත සිතකින් 'මගේ සිතේ මේ විදියට අකුසලයක් පහළ උනා' 'මේක රාගය මේක තරහව මේක ද්වේශය මේක උද්ධච්චය කියලා ඒ පහළ වෙච්ච අකුසල ධර්ම අරමුණු කරමින් අරමුණු කරමින් හොඳට මෙනෙහි කරනවා. එතකොට මේ වෙලාවේ අපේ හිතේ පහළ වෙන්නේ ඒ අකුසල් අරමුණු කරන හොඳ කුසල් සිත්. අකුසල් දකින කුසල් සිත්. මේ කුසල් සිත් වලට ඉස්සරවෙලා පහළ වෙච්ච අකුසල ධර්මයෝ ආරම්මණ ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා. ඒක නිසා තමයි කියන්නේ **අකුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස ආරම්මණපච්චයෙන පච්චයො** = අකුසල ධර්මයක් කුසල ධර්මයකට ආරම්මණ ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා කියලා.

තවත් එකක් තිබෙනවා. අපි හිතමු මෙහෙම. වෙනත් කෙනෙකුගේ සිතක් බලන්න හැකියාව තිබෙන චේතොපරියඥාණය තිබෙන හොඳ ශක්තියක් තිබෙන ආර්යන් වහන්සේ නමක් හෝ වේවා පෘතක්ජන කෙනෙක් හෝ තමන්ගේ ඒ පරසිත් දකින්නා වූ කුසල් සිතෙන් අනිත් කෙනෙකුගේ සිතේ පහළ වෙච්ච අකුසලයක් බලනවා. ලොව්තුරා බුදුරජාණන්වහන්සේ ධර්ම දේශනා කරන කොට මේ සිද්ධිය වෙනවා. ලොව්තුරා බුදුරජාණන්වහන්සේගේ සිතේ පහළ වෙන්නාවූ ඒ චේතොපරියඥාණය (මේ සිත බුදුරජාණන්වහන්සේට පහළ වෙන බැවින් මෙය ක්‍රියා සිතක්, තථාගතයන් වහන්සේ රහත් නිසා.) නමුත් අපි මේක අපි මෙතනට දාල බලමු. එතකොට ඒ චේතොපරියඥාණයට අනිත් කෙනෙකුගේ සිතේ පහළ වෙන්නා වූ අකුසල් සිත අරමුණු වෙනවා. එතකොට සිද්ධ වෙන්නේ **අකුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස ආරම්මණපච්චයෙන පච්චයො.** (ඇත්තටම මෙතැන වෙන්න ඕන අකුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස ආරම්මණපච්චයෙන පච්චයො. නමුත් මේක විස්තර කරන්නයි කිව්වේ).

අපි සාමාන්‍යයෙන් රහත්භාවයට යන්නේ නැතුව ගත්තොත් එහෙම සෝවාන් සකෘදාගාමී අනාගාමී ආර්යන් වහන්සේලා වශයෙන් බැලුවොත් අනිවාර්යෙන්ම කුසල් සිතකට අකුසල් සිත් අරමුණු වීමක් වෙන්නේ. පෙර ජීවිත සිහිපත් කරන පුබ්බෙනිවාසානුස්සතිඥාණයෙන් අපේම ජීවිත සිහිපත් කරනකොට පරණ කරපු අකුසල ධර්ම අරමුණු වෙනවා ඒ පුබ්බෙනිවාසානුස්සතිඥාණයට. එතකොට වෙන්නෙත් **අකුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස ආරම්මණපච්චයෙන පච්චයො.** අනාගතයේ බැලුවත් එහෙමයි. ඔය විදියට තමයි මේක සිද්ධ වෙන්නේ.

එතකොට අකුසල ධර්මයක් පහළ වෙනකොට එය අකුසල ධර්මයකටත් ආරම්මණ ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වීම සිද්ධ වෙනවා. අකුසල ධර්මයක් කුසල ධර්මයකටත් ආරම්මණ ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා.

දැන් තව විදියක් කියනවා. අපි මෙහෙම හිතමු. යම්කිසි කෙනෙක් භාවනා කරලා කරලා සෝවාන් වෙනවා. සෝවාන් ඵලයට පත් උනාට පස්සේ ඒ ආර්යන් වහන්සේගේ සිතේ පහළ වෙනවා 'මගේ සිතේ යම්කිසි කලේශ ධර්ම සමුදායක් නැතිවෙලා ගියා' කියලා තමන්ගේ සිතේ ඉස්සරවෙලා තිබිච්ච දැන් නැති ඒ අකුසල් ප්‍රත්‍යයවේක්ෂණය වීමක් මෙනෙහි වීමක් සිද්ධ වෙනවා. එතකොට සෝවාන් උනාට පස්සේ පහළ වෙන ඒ කුසල් සිත් වලින් අරමුණු කරන්නේ ඉස්සරවෙලා තිබිලා නැතිවෙලා ගිය අකුසල්. එතකොටත් වෙන්නේ ඒ බලන අකුසල් ටික කුසල් සිතට ආරම්මණ ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා. තමන් ඉස්සෙල්ලා යටකරපු කෙලෙස් ගැන හිතනකොට ඕක සිද්ධ වෙනවා. දැන් මේ විදීයට ආර්යන් වහන්සේලා පුරුදු කරපු කෙලෙස් සහ නැති කරපු කෙලෙස් පිළිබඳව මෙනෙහි කරනකොට අකුසල ධර්මයන් කුසල ධර්මයන්ට ආරම්මණය වීම තමයි එතනදී සිද්ධ වෙන්නේ. මේක පෘථක්ජනයන් වහන්සේලා වශයෙන් ඒවාගේම ශෛක්ෂන්ගේ වශයෙනුත් තිබෙනවා.

විපස්සනා කරනකොටත් තිබෙනවා මෙහෙම. සිතේ පහළ වෙච්ච අකුසලයක් අපි අනිත්‍යය වශයෙන් දුක්ඛ වශයෙන් අනාත්ම වශයෙන් මෙනෙහි කරනවා. පිඩාවක් හැටියට මෙනෙහි කරනවා. එවෙලෙට මෙනෙහි කරන්නේ අකුසල ධර්මයක්. ඒ අකුසල ධර්මය මෙනෙහි කරන්නේ කුසල ධර්මයකින්. එතකොටත් අකුසල ධර්මය කුසල ධර්මයකට ආරම්මණ ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙන ස්වභාවය තිබෙනවා.

මේ විදියට අපි ඉස්සෙල්ලා කිව්වා වගේම අකුසල ධර්මයක් අකුසල ධර්මයක පහළ වීමටත් අකුසල ධර්මයක් කුසල ධර්මයක පහළ වීමටත් ආරම්මණ ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා.

දැන් මම මේ කියාගෙන ආවේ අදට අපි මේ පාඩමෙන් කළයුතුව තිබු continuation එකක්. මේක එතරම් දිගට යන්නේ නෑ. මම හිතනවා මේ පින්වතුන් මේ ආරම්මණ ප්‍රත්‍යය පිළිබඳව යටතේ ගොඩක් ඇහුවා. මේකේ එක එක වාර කුසල් සිත් වශයෙන් දිබ්බචක්ඛුඤාණ වශයෙන් ඉද්ධිවිධඤාණ වශයෙන් දිගට ගොඩක් යනවා. නමුත් අපි අද මේ ටිකේ ඉඳලා ඉස්සරහට මේ පින්වතුන්ට සකච්ඡා වාරයක් ලබා දෙනවා. මේ අපි කියන්නා වූ දේවල් මේ පින්වතුන්ගේ ග්‍රහණයට මේ පින්වතුන්ගේ සිත්වලට අහුවෙනවාද එක්කාසු වෙනවාද කියලා. ඒකත් අපි දැනගෙන ඉදිරි පාඩමකට එකතුවෙමු. මේ වේලාවේදී තෙරුවන් සරණයි කියලා මේ පින්වතුන්ට අපි මෛත්‍රීයෙන් ආශිර්වාද කරනවා. ගම්භීර ධර්ම කොට්ඨාසයක එක්තරා අවස්ථාවක් තමයි මේ. මෙතැන ඉඳලා ඉස්සරහට පොඩි සාකච්ඡාවක් හැටියට අද දවසේ කාලය ඒ සඳහා යොදමු. හැම එක්කෙනාටම ධර්ම අවබෝධ වේවා! එවාග්ම නිර්වාණ අවබෝධය වේවා! හොඳට මේ කියන්නා වූ ආරම්මණ ප්‍රත්‍යය ස්වභාවය තේරුම් අරගන්න ලැබේවා! හැම ධර්මයකින්ම අපේ හිතට දැනෙනවානම් යම් කිසි දෙයක් ඒ හැම ධර්මයකම තිබෙනවා ආරම්මණ ශක්තිය. ආරම්මණ ගුණය. සුළගේත් තිබෙනවා. වැස්සෙත් තිබෙනවා. අව්වෙත් තිබෙනවා. නිවනෙත් තිබෙනවා, ආරම්මණ ප්‍රත්‍යය ගුණ ස්වභාවය. එහෙම ගතියක් තිබෙන නිසා තමයි අපිට ඒ දේ අරමුණු කරන්න පුළුවන් කම තිබෙන්නේ. ඒ ධර්ම ස්වභාවය හොඳට වටහාගෙන සියලු දෙනාටම සසර දුකෙන් මිදී නිවනින් සැනසෙන්න ලැබේවා කියලා

ප්‍රාර්ථනා කරනවා. මෙතැනින් ඉස්සරහට අපි පොඩි සාකච්ඡාවක් හැටියට ප්‍රශ්න නිරාකරණය කරගන්න අපි යොදා ගනිමු. සැම දෙනාටම තෙරුවන් සරණයි!

සාධු! සාධු! සාධු! අප්‍රමාණ පිං

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස **අකුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස ආරම්මණපච්චයෙන පච්චයො** කියන තැන අකුසල් සිත් 12 චෛතසික 27 ගත්තොත් ඒවා තමයි ප්‍රත්‍යය වෙන්නේ. ප්‍රත්‍යය උප්පන්න වශයෙන් ස්වාමීන්වහන්ස දේශනා කළා කාමාවචර කුසල් සිත් 8 ත් චෙතොපරිය කුසල අභිඤ්ඤා සිතත් පෙර විසුකඳ පිළිවෙත බලන කුසල අභිඤ්ඤාවත් ආදී වශයෙන් ලැබෙනවා කියලා. ස්වාමීන්වහන්ස එතැන චෛතසික වශයෙන් ගත්තහම අප්‍රමාණ චෛතසික අත්හැරලා තිබෙන බව දැන ගන්නා ලැබුණා එක කියවපු තැනක. ඒකට හේතුවක් තිබෙනවද ස්වාමීන්වහන්ස?

<u>පිළිතුර</u> - ඕකේ තිබෙනවා බෙදීමක් සහ විග්‍රහයක්. ඒකාන්ත සහ අනේකාන්ත කියලා. ඕක තමයි මහත්තයා සමහර වෙලාවට ඕවා විග්‍රහ කරන තැන් වල පොත පත්වල තිබෙන්නේ. අකුසල චෛතසික ධර්ම හැටියට තිබෙන්නේ 12 යි. ඒකෙනුත් අකුසල ධර්ම හැටියට වැඩියෙන්ම ඔය වැඩේට බැහැල කටයුතු කරන ඒවා හැටියට තිබෙන්නේ ‘රාග’ ‘දිට්ඨි’ ඇතුළු 5 යි. නමුත් ඔක්කොම 14 තිබෙනවා. මේ අකුසල ධර්ම 14 අරගෙන කිව්වොත් එහෙම ඔය ටික විතරයි. මේ අකුසල චෛතසික ධර්ම 14 ටම පමණක් ඒ අකුසල සිතක එහෙම තනියම හුදකලාව ක්‍රියාත්මක වෙන්න බෑ. ඒක නිසා අර කියන්නා වූ අන්‍යසමාන චෛතසික ඒකෙ යෙදෙනවා. ඒක නිසා තමයි ඔය 27 යි අකුසල සිත් 12 යි හැටියට කියන්නේ. මහත්තයා මේකනේද ඇහුවේ?

ස්වාමීන්වහන්ස ප්‍රත්‍යය උප්පන්න ඔබ වහන්සේ අපිට විස්තර කළා කුසල සිත් 8 යි ඊට පස්සේ චෙතොපරියඤාණය පුබ්බෙනිවාසානුස්සතිඤාණය ආදී වශයෙන් ඇතිවෙනවා කියලා. එතකොට ඒ ඇතිවෙන ඒවත් එක්ක ඇතිවෙන චෛතසික ධර්ම වලින් කරුණා මුදිතා දෙක අයින් කරලා තිබෙනවා, ඒකට හේතුව ස්වාමීන්වහන්ස?

<u>ස්වාමීන්වහන්සේ</u> - අප්‍රමාණ දෙක අයින්කරන්නේ මේ දෙක යෙදෙන්නේ සත්ව සංඥාව මුල් කරහෙන. ඒක සංඥාවක්. සත්වයෙක් කියලා නැති උනත් සත්ව සංඥාවක් තිබෙනවා. ඒක නිසා සුවපත් වේවා කියලා කියන්න පුළුවන්කම තිබෙන්නේ සත්ව සංඥාවකටයි. සැපවත් වේවා අනිත් කෙනා සතුටින් ඉන්නවා කියලා කියන්න පුළුවන් කම තිබෙන්නේ සත්ව සංඥාවක් අරමුණු කරගෙනයි. එතකොට මේ අප්‍රමාණ කරුණා මුදිතා දෙක කිසිම අවස්ථාවකදී අකුසලයක් අරමුණු කරන්නේ නෑ. ඒක නිසා තමයි ඒක අතහැරලා තිබෙන්නේ.

<u>ජයන්ත මහත්මයා</u> - ස්වාමීන්වහන්ස යම් කිසි අවස්ථාවක සතෙකුට හිංසා කරන අවස්ථාවක් දැක්කොත් අපි සතාට අනුකම්පාව දක්වනවා වගේම අපි හිතනවා ‘මේ මනුස්සයත් සුවපත් වෙන්න ඕන’ කියලා කරන වැරදි වැඩ නිසා. ආන්න ඒ වගේ අවස්ථාවක කරුණාව යෙදෙන්නේ නැද්ද කියලා හිතුවේ.

<u>ස්වාමීන්වහන්සේ</u> - ඒ අවස්ථාවේදී ඒක යෙදෙන්නේ නෑ මහත්තයා. ඒකට හේතුව එක වෙලාවකට සත්වයා ගැන හිතනවා. එක වෙලාවකට සතාට හිංසා කරන මනුස්සයා ගැන හිතනවා. මනුස්සයෙක් සත්වයෙකුට හිංසා කරනවා කියන ඒ ක්‍රියාව මනුස්සයයි හිංසා කිරීමයි හිංසාවට යටත් වෙන්නා වූ සත්වයයි තුන්දෙනාම එක්කාසු කරලා එක ක්‍රියාවක් යටතේ අපි සමාන්‍යයෙන් ඕලාරික හැටියට කථා කරනවා. නමුත් මෙතැනදී ඒ අවස්ථා තුනක්. සත්වයා ගැන හිතනවා. ඒ එක අවස්ථාවක්. ඒ අර පීඩාවට පත්වෙන කෙනා ගැන. ඊළඟට පීඩා කරන එක්කෙනා ගැන හිතනවා ඒ තව අවස්ථාවක්. ඒ වාර දෙකකදී. තවත් වේලාවක ඒ පීඩාව කියන ක්‍රියාව ගැන හිතනවා. එකම අවස්ථාවක මේ තුනම වෙන්නේ නෑ.

මේ ආරම්මණ ප්‍රත්‍යය කථාව එන්නේ ඒවා එකින් ඒකට වෙන් කරලා ගන්න කොටයි. ඒක නිසා හිංසාව ලබන සත්වයා ගැන හිතන කොට අපිට කරුණාවක් ඇතිවෙනවා. හැබැයි තරහ ඇතිවෙන්නේ නෑ. ඒවගේම අනිත් පැත්තට මනුස්සයා ගැන හිතනකොට එතකොට ඇති වෙන්නේ කරුණාවක් නොවෙයි, එතකොට හිතන්නේ කර්මයක් ගැන. 'මේ මනුස්සය මේ සතාට දෙන්නා වූ මේ පීඩාව නිසා මෙයාටත් අනාගතයේදී මේ විදියයි වෙන්නේ' කියලා හිතනවා කියලා කියන්නේ එයා එවෙලෙට කර්මය ගැන සලකනවා. එයා මෛත්‍රීය ගැන හිතන එකවත් කරුණාව ගැන හිතන එකවත් මුදිතාව ගැන හිතන එකවත් නොවෙයි එයා අනාගතයේ විඳින්නට තිබෙන කර්මය ගැන හිතනවා. ඒක නිසා මේ අවස්ථාවන් වෙනස්.

<u>ප්‍රශ්නය</u> - **'රාගං අස්සාදෙති අභිනන්දති; තං ආරබ්භ රාගො උප්පජ්ජති, දිට්ඨි උප්පජ්ජති, විචිකිච්ඡා උප්පජ්ජති, උද්ධච්චං උප්පජ්ජති, දොමනස්සං උප්පජ්ජති'** කියන තැන ස්වාමීන්වහන්ස ඒ දෙක එකට යෙදෙනවා. එකියන්නේ රාගය අස්වාදනය කරනකොට ඒ අභිනන්දනය කරනකොට ඒක නිසා රාගය උපදිනවා කියලා තේරෙනවා ස්වාමීන්වහන්ස. දිට්ඨි උප්පජ්ජති කියන එකත් තේරෙනවා. ඊටපස්සේ ඒ ආස්වාදනය කරන නිසා දෝමනස්සය උපදිනවා කියන එක පොඩ්ඩක් පැහැදිලි කරලා දෙන්න ස්වාමීන්වහන්ස. ඒක එකම අවස්ථාව දී සිදු වෙන දෙයක්ද? නැත්නම් කලින් ආස්වාදනය කරපු නිසා පසුව දෝමනස්සයක් පහළ වෙන දෙයක් ගැනද කියන්නේ කියලා. තෙරුවන් සරණයි!

<u>පිළිතුර</u> - එතැනදී තිබෙන්නේ තමන්ගේ ස්වකීය හිත තුල තමන්ගේ ඉස්සරවෙලා හිතේ පහළ වෙච්ච අකුසල් සිතක් අරමුණු කරගෙන පසුව පහළ වෙන්නා වූ දෝමනස්සයයි. සමහර වෙලාවට තිබෙනවා විසම රාගය කියලා. විසම රාගය කියලා කියන්නේ නොමනා තැන පහළ වෙන රාගය. එහෙම ඇති උනහම ඒ රාගය පිළිබඳව දෝමනස්සය ඇතිවෙනවා. ඇත්ත වශයෙන්ම මේක විග්‍රයක්. රාගය රාගයමයි නමුත් අපි මෙහෙම හිතමු.

ස්වාමියා තමාගේ භාර්යාව සම්බන්ධයෙන් රාග සිතක් පහළ කරනවා. ඒක ඉතින් සාමාන්‍යයෙන් ලෝකයා පිළිගත්ත දේ. නමුත් අපි හිතමු ඒ පිළිගත්තකෙනා තමන්ට අයිති නැති තමන්ගේ නොවන වෙනත් භාර්‍යාවන් කෙරෙහි හෝ එහෙම නැත්නම් වෙනත් කෙනෙක් කරෙහි හෝ නෑ දෑ කෙනෙක් කෙරෙහි හෝ රාග සිතක් පහළ කරනවා. රාගය පහළ උනහම එයා ගිහිල්ලා එයා එයාටම සාප කරගන්නවා. 'ඇයි මට මෙහෙම උනේ' කියලා ඒ හිතට සාප කරනවා දොස් කියනවා. සමහර අය එහෙම කියනවා. ඒ තමයි

රාගය නිසා පස්සේ දෝමනස්සය පහළ වෙන හැටි. විසම රාගය කියලා කියන්නේ වැඩිහිටි අයට බාල අයට අදාල නොවෙන අය කෙරෙහි පහළ වෙන්නා වූ රාග සිත් වලට. 'ඇයි මට මෙහෙම හිතුනේ මට මහා පවුකාර හිතක් තියෙන්නේ' කියලා සමහරු කියනවා, ඒ තමයි ද්වේශය. ඉස්සරවෙලා පහළ වෙච්ච රාගය ආසාව ලෝභය අරමුණු කරගෙන ඒ විදියට ද්වේශය පහළ වෙනවා.

බොහොම පිං ස්වාමීන්වහන්ස. තෙරුවන් සරණයි!

<u>ප්‍රශ්නය</u> - **අකුසලො ධම්මො අකුසලස්ස ධම්මස්ස ආරම්මණපච්චයෙන පච්චයො** කියන තැන ප්‍රත්‍යය ධර්ම වශයෙන් අකුසල් සිත් 12 කියලා තිබෙනවා. එතකොට ඊට පරිබාහිරව දෙයක් එන්න විදියක් නැති නිසා ඒ ප්‍රත්‍යය ධර්ම වලින් පමණයි ප්‍රත්‍යය උප්පන්න ධර්ම ඇතිවෙන්නේ කියලා හිතුවහම ඒ ප්‍රශ්නයට පහසුවෙන් උත්තරයක් හම්බ වෙනවා නේද ස්වාමීන්වහන්ස?

අනිත් එක ස්වාමීන්වහන්ස සාමාන්‍යයෙන් රාගය ගැන හිතලා ඊර්ෂ්‍යාවත් ඇතිවෙනවා. ඇයි ඒවගේ දෙයක් මෙතැන සඳහන් වෙලා නැත්තේ? ඊර්ෂ්‍යාව මාන්නය වගේ දේවල් ඔක්කොම එකට අරගෙනද දෝමනස්සය කියලා අරගෙන තිබෙන්නේ?

<u>පිළිතුර</u> - මේවගේ තැන්වල මහත්තයා හරි පොඩි කෙන්දක වගේ පොඩි වෙනසක් තිබෙන්නේ. දැන් ඔය උද්ධච්චය විචිකිච්ඡාව වගේ දේවල් අනිත් සිත් වල යෙදෙන නිසා ඒකෙ කිසි ප්‍රශ්නයක් නෑ. හැබැයි ඊර්ෂ්‍යාව කුක්කුච්ඡය වගේ ඒවා යොදන්නේ නැත්තේ ඒවා දෝමනස්සයේම අන්තර්ගත වෙලා තිබෙන නිසා. අනිත් එක තමයි, දැන් මේක ආධ්‍යාත්මික වශයෙනුත් භාහිර වශයෙනුත් දෙකටම යනවා. ඊර්ෂ්‍යාවක් සාමාන්‍යයෙන් පහළ වෙන්න නම් වෙනත් කෙනෙක් ඕකට සම්බන්ධ වෙන්න ඕන. පර හිතක්, අන්‍ය හිතක් තිබෙන්න ඕනෑ. තමන්ගේ හිතටම තමන්ටම ඊර්ෂ්‍යාව ඇතිවෙන්නේ නෑ. අනිත් කාරණය තමයි තිබෙන්නේ ඉස්සා මාන්න දෙක හැම වේලාවෙම තව එක්කෙනුකට හේත්තුවක් දාගෙන තමයි පහළ වෙන්නේ. ඊර්ෂ්‍යා කරනවා නම් අනිත් එක්කෙනාට මෙහෙම උනේ ඇයි කියලා අනිත් එක්කෙනාගේ එල්ලිලා අකුසල වශයෙන්. මාන්නය කරනකොටත් අනිත් එක්කෙනාට වඩා මම වෙනස් කියලා හැම වේලාවේම මේ දෙක තවත් කෙනෙකුට හේත්තුවක් දාගෙන තමයි පහළ වෙන්නේ. ඒක නිසා මේ දෙක එන්නේ නෑ.

ඒවගේම තමයි අර ඉස්සෙල්ලා අහපු අප්‍රමාණ දෙකත් අතහරින්නේ ඔය කාරණය නිසා තමයි. ඒවත් හැම වේලාවේම වෙනත් කෙනෙකුට සම්බන්ධ වෙලා සත්ව සංඥාව හැටියට එන හින්දයි. ඊළඟට අනිත් කෙලෙස් ටික ඕකට එනවා. ප්‍රධාන වශයෙන් එන 5 තමයි කියලා තිබෙන්නේ. අනිත් ඒවා සියුම් විදියට included. තෙරුවන් සරණයි!

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස **රාගං අස්සාදෙති අභිනන්දති** කියලා කිව්වහම අරමුණක් සම්බන්ධයෙන්නේ රාගය ඇතිවෙන්නේ. එක්කෝ ළමයි ගැන හරි මොකක් හරි ලැබෙන සම්පතක් ගැන. එතකොට ඒ දේ නැතිවෙලා ගියොත් මට මේ සතුට නැතිවෙයි කියලා දෝමනස්සයක් ඇතිවෙන එක එතැනට අදාළද ස්වාමීන්වහන්ස?

<u>පිළිතුර</u> - **රාගං ආරබ්භ රාගො උප්පජ්ජති** කියලා කියනකොට ඔතන ගන්නේ අර ලෝභ මූල සිත්වල පහළ වෙන ලෝභය. එතකොට ඒ ලෝභය පිළිබඳව රාගය පහළ වෙනවා කියන එක ලෝභය පහළ වෙනවා කියන ඉස්සෙල්ලා කියපු විදියට එක හරි සරලයි. නමුත් මෙතැන තිබෙන්නේ 'මේ තිබිච්ච ස්වභාවය මට නැතිවෙලා යයි' කියලා ගත්තහම එතැන ඇතිවෙන්නේ ද්වේශ සහගත බයක්. බයකට දෝමනස්සය පහළ වෙනවා ඒකෙ කඩා වැටීම අරමුණු කරගෙන. තව එකක් තමයි බයෙන් බැලීමයි ඇත්තෙන් බැලීමයි කියලා කියන්නේ දෙකක්. බයෙන් බලනවා කියලා කියන කොට ඒකට ගැටිලා ලෝභ කරලා ඒක කඩා වැටෙයි කියලා සැක සහගත තද ඇලීමකින් හරි බයක් ඇතිවෙනවා. ඒක අකුසල්. නමුත් ඤානවන්ත සිතකිනුත් බලන්න පුළුවන් මේවා කැඩෙනවා බිඳෙනවා නැතිවෙනවා කියලා. එතකොට කුසල් වෙනවා. අර සච්චවිභංග සූත්‍රයේ තිබෙන කොටස වගේ. ඒ කියන්නේ මට කැමති දේ නොලැබී යෑමේ දුක සහ අකමැති දේ ලැබීමේ දුක, එතැනත් තිබෙනවා ද්වේශය. ඒකත් තරමක් include කරන්න පුළුවන් නමුත් කෙලින්ම අරමුණු කිරීම තමයි මෙතැනදී සිද්ධ කරන්නේ.

<u>ප්‍රශ්නය</u> - එතකොට එතැනදී අකුසල් සිත් වල තිබෙන සෝමනස්ස වේදනාවකුත් තිබෙනවා. එතකොට කොහොමද ස්වාමීන්වහන්ස සෝමනස්ස සහගත සිතක් ඇති උනොතේ ඒ රාගය තිබෙන තැනද සෝමනස්ස වේදනාවක් ඇති වෙන්න පුළුවන් කම තිබෙන්නේ?

<u>පිළිතුර</u> - මෙහෙමයි, සාමාන්‍යයෙන් සාමූහිකව ගත්තහම සෝමනස්සය කියන්නේ ප්‍රීති චෛතසිකය. ප්‍රීති චෛතසික තිබෙනවා වේදනා චෛතසික තිබෙනවා. ඒ ප්‍රීති චෛතසිකයයි වේදනා චෛතසිකයයි දෙකම තිබෙන්නේ අන්‍යසමාන වල. වේදනාව තිබෙන්නේ සර්ව චිත්ත සාධාරණ වල අනිත් එක ප්‍රකීර්ණක වල. ඒවා අකුසල් වෙන්නේ අකුසල් සිත්වල අනිත් චෛතසිකත් එක්ක එක්කාසු වෙලා ගියහම. එහෙම නැති වෙලාවට ඒවා අකුසල පැත්තට දාල කථා කරන්නේ නෑ. විශේෂයෙන්ම මේ අකුසල් 14 න් අකුසල හැටියට ඉදිරිපත් වෙලා හයිය ගැම්මක් අරගෙන වැඩ කරන්න ඉස්සරහට එන ඒවා පහක් තමයි මේ හඳුනාගෙන තිබෙන්නේ. මේ ප්‍රත්‍යය කථාවේදී මේ වීථිවලට දාල යොදන්නේ 'රාගය' 'දෘෂ්ඨිය' ඒවාගේම 'විචිකිච්ඡාව' 'උද්ධච්චය' සහ 'දෝමනස්ස' යයි.

සරලව කිව්වොත් එහෙම අකුසල චෛතසික ධර්ම 14 තිබුණාට මූල වශයෙන් ගත්තම අපි තුනයි කියන්නේ. ඒ තමයි 'රාග' 'ද්වේශ' 'මෝහ'. එතකොට රාගය තිබෙනවා මෝහය අනිවාර්යෙන්ම තිබෙනවා. දෘෂ්ඨිය ඒකෙ ප්‍රධාන කොටසක් කරනවා. ඒක නිසා තමයි ඒ අකුසල් පහළ වෙනවා කියලා අනිත් ඒවත් අන්තර්ගත කරමින් ප්‍රධානම කටයුතු කරන්න ඉදරිපත්වෙන මේ 5 යොදලා තිබෙන්නේ.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස අපි සූත්‍ර දේශනා වල කථා කරනවා නෙක්ඛම්ම දෝමනස්සය කියලා. එතකොට ඒ දෝමනස්සය අභිධර්මානුකූලව බැලුවොත් කොහොමද විස්තර කරගන්න පුළුවන් වෙන්නේ ස්වාමීන්වහන්ස?

<u>පිළිතුර</u> - නෙක්ඛම්ම දෝමනස්සය කියන එක යොදනවා නම් තිබෙන්නේ නෙක්ඛම්මය කුසලයි. දෝමනස්සය අකුසලයි. **කුසලො ධම්මො අකුසලස්ස ධම්මස්ස ආරම්මණපච්චයෙන පච්චයො** කියන තැන තමයි ඒක වැඩ කරන්නේ.

ඒ කියන්නේ ස්වාමීන්වහන්ස නෙක්ඛම්ම දෝමනස්සය අකුසලයක් නොවෙයි වගේ සාමාන්‍යයෙන් කථා කරන්නේ. නමුත් අපි ඒක කඩලා ඇතුලට ගිහිල්ලා බලනකොට ඇත්තටම අකුසල ධර්මයක් තමයි එතැන පහළ වෙන්නේ නේද ස්වාමීන්වහන්ස?

<u>ස්වාමීන්වහන්ස</u> - බුදුරජාණන්වහන්සේ දුක්ඛ ආර්යසත්‍ය දේශනා කරනකොට සඳහන් කරලා තිබෙනවා **සෝක පරිදේව දුක්ඛ දෝමනස්ස** කියලා. ඒකෙ බලන්න සෝකය හටගන්නවා දුකක් හටගන්නවා ඊළඟට පරිදේවය කියලා කියන්නේ අඬන එක. මේක තිබෙන්නේ දුක්ඛ සත්‍යයේ. මේක අකුසල්. ඒක එහෙම උනාට නැවතත් බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා සූත්‍ර දේශනා වල ''ඔබලා මහණ දම් කිරීමේදී ශ්‍රමණධර්ම වැඩීමේදී අඬ අඬා හෝ මේ මහණ කම කරන්න'' කියලා. අඬ අඬා මේ මාර්ගයේ යන්න. ඔබලා ඇඬුවත් අඬ අඬා මේ මාර්ගය වැඩුවත් ඒත් ප්‍රතිඵලය සාර්ථකයි කියලා. මෙතැන ඇතිවෙන්නේ පොඩියට දෝමනස්සයක්. ඒක ඇතිවෙන්නේ නරකක් කරන්න ගිහිල්ලා නොවෙයි. එක හොඳක් කරන්න ගිහිල්ලා. හොඳක් කරන්න ගිහිල්ලා පීඩාවක් ඇතිවෙනවා. හොඳ කරන්න ගිහිල්ලා පොඩි අපහසුවක් ඇතිවෙනවා. නමුත් හොඳක් කරන්න ගිහිල්ලා ඇති වෙන්නා වූ ඒ පීඩාව ඒ දුක ඒ ඇඬීම සූත්‍ර දේශනාවේ හැටියට ඇත්තටම හොඳ දෙයක්. එහෙම කරන්න කියලා කියනවා. නමුත් ඒක අභිධර්මයට ගෙනාවට පස්සේ එතැන තිබෙන්නේ **කුසලො ධම්මො අකුසලස්ස ධම්මස්ස ආරම්මණපච්චයෙන පච්චයො** කියන එකයි. නමුත් සමහර තැන් වල දෝමනස්සයක් ඇති උනාට ඒක හොඳ දෙයක් කරනවා.

එක තැනක තිබෙනවා ධම්ම පදයේ ලස්සන ගාථාවක් කියලා **නිග්ගය්හවාදිං මෙධාවිං, තාදිසං පණ්ඩිතං භජෙ** = තමන්ව පහත් කරලා සලකන්නාවූ නමුත් ඥානවන්ත වූ පණ්ඩිතයන් ඇසුරු කරන්න කියලා. බුදුරජාණන් වහන්සේ සමහර අවස්ථාවලදී අනිත් අයට දොස් කියනවා. මෝඝ පුරුෂයා කියනවා. හිස් පුරුෂයා කියනවා. ලාමකයා කියලා කියනවා. එළවා ගන්නවා. බුදුරජාණන්වහන්සේ එහෙම කරනවා. බුදුරජාණන් වහන්සේ නොදකින්නේ නෑ, මම මෙහෙම බැන්නහම අනිත් එක්කෙනාගේ සිතේ අකුසල් සිත් පහළ වෙනවා තථාගතයන් වහන්සේ කෙරෙහි අසන්තෝසයක් අමනාපයක් දෝමනස්සයක් හදා ගන්නවා කියලා. ඒක බුදුරජාණන්වහන්සේට පේනවා. ඒ උනාට ඒ පුංචි අකුසලය ඇති උනාට තථාගතයන් වහන්සේ අහිතකින් නොවෙයි එහෙම කරන්නේ. තථාගතයන් වහන්සේගේ තිබෙන්නේ හොඳ කරුණාබර හිතක්. ඒක කරුණාබර හිත උනාට වචනය ලබා දෙන්නේ rough එකට. එතකොට අර අනිත් අයගේ සිත් එකේදී තැලෙනවා. අකුසල ධර්ම පහළ වෙනවා. ඒ අයට දැනුමක් පෙනුමක් නෑ තථාගතයන් වහන්සේ කරුණාවෙන් අපිව හදන්න කරන එකක් කියලා. ඒ අයට තිබෙන්නේ වැරදි වැටහීමක්. බුදුරජාණන්වහන්සේ අපිට බැන්නා දොස් කිව්වා එළවා ගත්තා කියන හැඟීම. එතකොට තිබෙන්නේ කුසල ධර්මයක් අරමුණු කරගෙන අකුසල ධර්ම පහළ වීමයි. සමහර වෙලාවට අඬනවා. වක්කලී හාමුදුරුවන්ට එහෙම කරපු දේවල් මතකයිනේ. කුසල ධර්මයන් අරමුණු කරගෙන අකුසල ධර්මය පහළ වීම. නමුත් ඒ අකුසල ධර්ම එහෙම උනාට පස්සේ හොඳ දෙයක් අරමුණු කරන නිසා අමුතු වෙදකමක් ඖෂධීය ගතියක් ඒකෙ තිබෙනවා.

කෙලෙස් සහගත යම් කිසි කෙනෙක් ඇවිල්ලා ආර්ය අෂ්ගියාංගික මාර්ගය සුන්දරයි සැපයි කියලා ගත්තට ආපු ගමන්ම ඒක සුන්දර නෑ, සැප නෑ. ඒක නිසා ඒ පැත්තට යන්න හරියට guide කරන්න ඕනෑ. ඒ තමයි ප්‍රායෝගික ප්‍රතිපදා ක්‍රමය. ඒ ප්‍රතිපදා ක්‍රමයේ යනකොට මේක philosophy එක. Philosophy එක කියලා කියන්නේ ඒ තුල සිද්ධ වෙන හොඳ නරක, නරකට හොඳ හේත්තුවෙන විදිය. හොඳට නරක ක්‍රියාත්මක වෙන විදිය. ඒවා පෙන්නලා දෙන දර්ශනීය ස්වභාවය තමයි මේ. ඒ දෙක දෙකක් නමුත් එයින් පිහිටක් වෙනවා. තෙරුවන් සරණයි!

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස අර සතර සතිපට්ඨාන සූත්‍රයේ එන පංච නීවරණ පබ්බයට එනකොට ඔය කරුණු ටික මෙනෙහිකරනවට අමතරව තව මොනවා හරි තිබෙනවද? ඕවා අදාළද කියලා පොඩ්ඩක් පැහැදිලි කරලා දෙනවා නම් බොහොම පිං ස්වාමීන්වහන්ස.

<u>පිළිතුර</u> - එතැන තිබෙන්නෙත් ලෝභය, ඒක කාමච්ඡන්දය නමින් එනවා. ද්වේශය තිබෙනවා. ඊළඟට ථිනමිද්ධය එක්කාසු කරගන්නවා. ඊළඟට උද්ධච්චය එක්ක ආපු කුකුස. ඒත් දෝමනස්සය. ඊළඟට විචිකිච්ඡාව. එතැනත් අලුතින් එක්කාසු වෙලා තිබෙන්නේ ථිනමිද්ධ දෙක. අනිත් ඒවා ඒවගේම තමයි. පදවලයි නම්වලයි වෙනසක් තිබෙනවා. කෙනෙකුට අහන්න පුළුවන් ඇයි එතැනදි ථිනමිද්ධය දැම්මේ නැත්තේ කියලා. කවදාකවත්ම රාගය අරමුණු වෙලා දිට්ඨීය අරමුණු වෙලා ථිනමිද්ධය ඇතිවෙන්නේ නෑ. ථිනමිද්ධය එන්නේ වෙනත් සැප ස්වභාවයක් අල්ලාගෙනයි. ඒකනිසා ඒක අන්තර්ගත කරන්නේ නෑ මෙතැන. නීවරණ පබ්බයට ගිහිල්ලා බලන කොට එතැන හරියට ගත්තොත් **අකුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස ආරම්මණපච්චයෙන පච්චයො** කියන එක ගලපන්න පුළුවන්.

එතැන යටින් ක්‍රියාත්මක වෙන්නේ ඒ විදියටයි. නමුත් ප්‍රතිපදාව හැටියට තිබෙන්නේ **යථා ච අනුප්පන්නස්ස කාමච්ඡන්දස්ස උප්පාදො හොති, තඤ්ච පජානාති** කියලා. ඒ කියන්නේ යම් කිසි පහළ වෙච්ච කාමච්ඡන්ද ස්වභාවය දැන ගත්තා කියන එකයි. ඒක දැන ගන්නේ කුසල් සිතකින්. පජානාති කියලා කියන්නේ සම්පජන්න ගතිය. එතකොට සිහිය තිබෙනවා. අකුසල ධර්මයක් දෙස කුසල ධර්මයකින් බලන ප්‍රතිපදා ක්‍රමය තමයි එතැන තිබෙන්නේ. මෙතැන කියන්නේ එතැන සිද්ධ වෙන ක්‍රියාත්මක වෙන විදිය. තෙරුවන් සරණයි!

තෙරුවන් සරණයි ස්වාමීන්වහන්ස සවනට සිසිලස වෙනුවෙන් අනේක අප්‍රමාණ පුණ්‍යානුමෝදනා කරනවා ස්වාමීන්වහන්ස ඔබ වහන්සේ අපි වෙනුවෙන් කරන කැප වීමටත් අනුග්‍රහයටත්. ඔබ වහන්සේට ඉතාමත් ගෞරවයෙන් යොමු වෙනවා අද දවසේ සාකච්ඡාව නිමා කරන්න. තෙරුවන් සරණයි!

හොඳයි සැමදෙනාටම තෙරුවන් සරණයි! සැප වේවා! මේ පින්වතුන් බ්‍රහස්පතින්දා දවස යොදාගෙන රාත්‍රී කාලයේ මේ උත්සාහයක් මහන්සියක් දරන්නේ ධර්ම අවබෝධයට පාරක් හදාගන්න. ඒ නිසා අදත් ඒ විග්‍රහාත්මක ධර්ම සාකච්ඡාවට තවත් කොටසක් අපි ඉදිරිපත් කරගත්තා බුදුරජාණන්වහන්සේ අපිට කියලා දීලා තිබෙන හැටියට. මේ ධර්ම සාකච්ඡාව තුලින් ගිය වතාවේ වගේම අපි කුසල් සිත් පහළ කරගත්තා. නොවැටහෙන තැන් වටහා

ගන්න අපි උත්සාහ කළා. වැටහිලා තිබෙන තැන් තව තව තහවරු කරගත්තා අවධි කරගත්තා. මේ සියල්ලම සිද්ධ කරන්නේ කුසල් සිත් පෙරටු කරගනෙයි. ඒ කුසල් සිත කියලා කියන්නේ ධර්ම දකින්නා වූ කුසල් සිතයි. මේ ධර්ම මාර්ගයේ ගමන්කොට කුසල් සිත් කුසල් සිත් හැටියට අවබෝධ කරගෙන අකුසලය අකුසලය හැටියට අවබෝධ කරගෙන සැම දෙනාටම සංසාරයෙන් මිදී නිවනින් සැනසෙන්න ලැබේවා! කියලා මෛත්‍රීයෙන් ප්‍රාර්ථනා කරන ගමන් මේ පින්වත් සැම දෙනාම මේ ධර්ම මාර්ගයට යොමුකරලා විසාල කර්තව්‍යයක් සිදු කරන ලලිත් මහත්මයාටත් ඒ පවුලේ සැම දෙනාටමත් ජයන්ත මහත්මයා, ප්‍රශ්න ඇසූ පින්වත් මහත්ම මහත්මීන් සැම දෙනාටමත් සැනසිල්ලක් යහපතක් ශාන්තියක් වේවා! සැම දෙනාටම නිදුක් නිරෝගී දීර්සායුෂ වේවා! මේ වෙසක් සමයේ තව තව හොඳට ගාම්භීර ධර්මය තුල හොඳට හිත් පිහිටුවාගෙන ඒවාගේම ධර්ම මනසිකාරයෙන් අවධි වෙන්න ධර්ම මනසිකාරයෙන්ම ජීවිතිය පවත්වන්න හැකි වේවා! සැම දෙනාටම මේ උතුම් දහම් මනසිකාරය පවත්වාගෙන ගොස් කෙළවර චතුරාර්ය සත්‍යය ධර්මයන් අවබෝධ කරගෙන අමාමහා නිවනින් සැනසෙන්න ලැබේවා! නිවන් පිණිස මේ කුසල් මේ පිං හේතු වසනා වේවා! කියලා මෛත්‍රීයෙන් ආශිර්වාද කරනවා. ප්‍රාර්ථනා කරනවා. සැම දෙනාටම තෙරුවන් සරණයි!

සාධු! සාධු! සාධු!

සීලවන්තං ගුණවන්තං - පුඤ්ඤක්ඛෙත්තං අනුත්තරං
දුල්ලබෙන මයා ලද්ධං - පස්සිතුං වන්දිතුං වරං
සාරිපුත්තාදි ථේරානං - ආගතං පටිපටියා
සද්ධා සීලං දයා වාසං - බුද්ධ පුත්තං නමා මහං



ඉහත සඳහන් ධර්ම දේශනාව අති පූජ්‍ය හන්තේ ජිනාලංකාර ස්වාමීන්වහන්සේ විසින් දේශිතයි.